
# සමනල පැංචී



මිහින්දි මෙත්සඳි යාපා

# සමනල පැංචී

කතාව හා චිත්‍ර

**මිහින්දි මෙත්සඳි යාපා**

ප්‍රකාශනය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ISBN 978-624-206-681-3

පළමුවන මුද්‍රණය 2023

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයන්ගේ නිසි අවසරයකින් තොරව මෙම ග්‍රන්ථය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ උපුටා ගැනීම, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික ආදී කවර මාධ්‍යකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම, බෙදාහැරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

# පිදුම

නිතරම ආදරයෙන් හැම දේම කියා දෙන ගයානි ගුරුතුමියටත්,

අනෙකුත් සියළුම ගුරුවරුන්ටත්,

සැමවිටම මා ළඟින්ම සිටින

මගේ ආදරණීය,

තාත්තාට,

අම්මාට,

අයියාට

හා

සීයාට.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකෝමත් එක කැලෑවක සමනල් පැටියෙක් සිටියා. එයා හරිම කරුණාවන්තයි. එයා හරිම ලස්සනයි. එයාගේ යාළුවා තමයි මුව පැංචී. ඒ දෙන්නා හොඳම යාළුවෝ.



ඔන්න ඉතින් එක දවසක් මේ දෙන්නා සෙල්ලම් කරමින් සිටින කොට පුංචි ළමයෙක් එතනට ආවා. එයා ලස්සනයි. සමනල් පැංචියි, මුව පැංචියි, පුංචි ළමයාටත් සෙල්ලම් කරන්න අඬගැහුවා.



ඔයාගේ නම මොකක්ද, සමනලී ඇහැවුවා. මගේ නම මලිති, පුංචි ළමයා කිවුවා. හරිම ලස්සන නමක්, මුව පැංචී කිවුවා.



ඔයාලාගේ නම් මොනවාද? මලිති ඇහැව්වා. මම තනුජ, මුව පැංචා කිවුවා. මම නතාෂා සමනලී කිවුවා.



මේ තුන්දෙනාට තවත් යාළුවෝ හම්බ උනා, වලස් පැටියා, හා පැංචා, ජිරාෆ් පුංචා ද එකතු උනා.



ටික කලක් යන කොට, මේ කැලේට වැස්ස නැති උනා. කැලේ සත්තු ඔක්කොම කලබල වෙලා. අයියෝ අපි ඔක්කොම ඉවරයි, වලස් පැටියයි, හා පැංචායි, ජිරෆ් පුංචායි, ඇවිත් නතාෂයි, තනුජයි එක්ක කථා කරමින් සිටියා. මේ වෙලාවෙම මලිතිත් මෙතෙනට ආවා.



අනේ මලිති, මේ බලන්නකෝ අපිට වෙලා තියෙන දේ, නතාෂා ඒගොල්ලන්ට වෙලා තියෙන කරදරය ගැන විස්තරේ මලිතිට කිවුවා.

ම්.....ම්.....මලිති කල්පනා කරා.

අපි සිංහයාට කියමු, මලිති කීවා.



ඉන්පසු කැලේ යාළුවෝ ටික සිංහයා හම්බවෙන්න ගියා. සිංහයෝ, අනේ සිංහයෝ මේ කැලේ වතුර නැනේ, තනුජ කිවුවා.

ම්ම්...මටත් මේකට විසඳුමක් හොයන්න බෑ, අපි ඔක්කොම ඉවරයි සිංහයා කිවුවා.



හරි වැඩේනෙ, සිංහයා තමයි කැලේ රජ්ජුරුවෝ, ඒත් එයාටත් විසඳුමක් නැනෙ, නතාෂා අනිත් යාළුවන්ට කිවුවා.



ම්...ම්....කමක් නෑ, එහෙනම් අපි වලාකුළු වලට කියමු, මලිති කිව්වා.

ඒක හොඳයි, අපි එහෙනම් වලාකුළුවලට කියමු, නතාෂා කිව්වා.



වලාකුළේ, වලාකුළේ...

ඇයි සමනල පැංචෝ මේ කලබලේ? වලාකුළු ඇහැව්වා.

අනේ මේ බලන්නකෝ අපිට වැස්ස නැතුව වෙලා තියෙන දේ, ගහ කොළ වේලිලා, මල් පරවෙලා, පොලොව ඉරි තැලිලා, බොන්න වතුර නෑ, කෑම නෑ, හරිම රස්නෙයි...මෙහෙම ගියොත් අපි ඔක්කොම මැරෙයි.



අනේ ඒක තමයි නේද? පොඩ්ඩක් ඉන්නකෝ අපි අනිත් වලාකුළු යාළුවොත් එක්ක කතාකරලා බලමු, වලාකුළ කිවුවා.

වලකුළු යාළුවනේ, මේ බලන්නකෝ, අපේ කැලේ යාළුවන්ට වැස්ස නැතිව හොඳටම අමාරු වෙලානේ, ඒ ගොල්ලෝ පවුනේ, අපි ඒගොල්ලන්ට වැස්ස දෙමුනේද?

ඔව්, ඔව්, අපිට තේරුනා...හා...හා... අපි ඒ ගොල්ලන්ට විගහටම වැස්ස දෙමු, ඔක්කොම වලාකුළු යාළුවෝ කැමති වුණා.



ඊළඟ දවසෙම කැලේ යාළුවන්ට වැස්ස ලැබුණා.

ඔන්න එදා ඉඳන් හැමදාම වැස්ස ලැබුණා.

නතාෂායි, තනුජයි, මලිතියි අනෙක් කැලේ යාළුවෝ සතුටින් වැස්සේ තෙමෙමින්ම සෙල්ලම් කළා.

**කථාව අවසන්.**

**ආදර්ශය**

පුංචි උනත්, එකතු වෙලා, කතා කරලා, කල්පනා කරලා වැඩ කලොත් ඕනෙම ප්‍රශ්නයකට උත්තර හොයාගන්න පුළුවන්.

# පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නුතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට


සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01



මිහින්දි මෙත්සඳි යාපා මහාමායා බාලිකා විද්‍යාලයේ දෙක ශ්‍රේණියේ බී පංතියේ ඉගෙනුම ලබනා දියණියකි.




9 786242 066813